# *ජී. දිලීප් අමුදන් එදිරිව මහලේකම් කාර්යාලය, උතුරු පළාත් සභාව*

RTIC Appeal/17/2017 (2017.07.10 දින පැවැත්වූ කොමිෂන් සභා රැස්වීමේ කොටසක් වශයෙන් අභියාචනය අසන ලදී.

**සභාපති** : මහින්ද ගම්මන්පිල මහතා

**කොමිෂන් සභා සාමාජිකයෝ:** ජ්‍යෙෂ්ඨ නීතිඥ කිශාලි පින්ටෝ-ජයවර්ධන
ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්.ජී. පුංචිහේවා
විනිසුරු ඒ.ඩබ්.ඒ. සලාම්
ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන්

**අභියාචක** : ජී. දිලීප් අමුදන්, 361 කස්තුරියාර් පාර, යාපනය.

**පොදු අධිකාරිය නියෝජනය කළේ** : කේ. තිවේන්ද්‍රම් මහතා, නම් කළ නිලධාරී/ලේකම්, දිසා ලේකම් කාර්යාලය, උතුරු පළාත් සභාව සහ වී. රවීන්ද්‍රන් මහතා, ප්‍රධාන කළමනාකාර සහකාර/තොරතුරු නිලධාරී, සභා ලේකම් කාර්යාලය, උතුරු පළාත් සභාව.

උතුරු පළාත් සභාවේ අමාත්‍යවරුන් ද ඇතුලුව පළාත් සභා සාමාජිකයන් තිස් එක් දෙනෙකු වෙත ලබාදී තිබෙන කළමනාකාර සහකාරවරුන් දෙදෙනා සහ කාර්යාල සහායකයා ගේ නම් සහ ලිපිනයන් වෙන් වෙන් වශයෙන් අභියාචක විසින් සිය තොරතුරු ඉල්ලීම හරහා ඉල්ලා තිබිණි. පනතේ 5(1)(ඔ) යටතේ පළාත් සභා සාමාජිකයන් වෙත පවතින වරප්‍රසාද උල්ලංඝනය කිරීමක් වශයෙන් සලකා එම තොරතුරු ඉල්ලීම ප්‍රතික්ෂේප කරනු ලැබිණි.

කොමිෂන් සභාව නම් කළ නිලධාරියා වෙත පෙන්වා දුන්නේ පොදු අධිකාරිය විසින් සඳහන් කර ඇති වරප්‍රසාදය පනතේ 5(1)(ඔ) වගන්තිය යටතේ පළාත් සභාවට පමණක් අදාළ වන අතර, පළාත් සභා සාමාජිකයන් වෙත පුද්ගලයන් වශයෙන් අදාළ නොවන බවයි. නම් කළ නිලධාරියා සඳහන් කළේ කළමනාකරණ සහකාර සහ කාර්යාල සහායක යන තනතුරු ස්ථිර ඒවා නොවන බව සහ, කලින් කලට ඒවා වෙනස් වන බව ය.

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(4) වගන්තිය යටතේ පනත සමග අනුකූලභාවය ඔප්පු කිරීමේ භාරය පොදු අධිකාරිය සතු වන බවයි. මේ අනුව එකී තොරතුරු ඉල්ලීම මගින් පළාත් සභාවේ වරප්‍රසාද උල්ලංඝනය වන්නේ කුමන ආකාරයෙන් ද යන්න පොදු අධිකාරිය විසින් පෙන්වා දිය යුතුය. හුදෙක් වරප්‍රසාද යැයි සඳහන් කිරීම පමණක් ප්‍රමාණවත් නොවේ.

මෙවිට නම් කළ නිලධාරියා කොමිෂන් සභාවට දැනුම් දුන්නේ 5(1)(ඔ) වගන්තිය යටතේ සඳහන් ව්‍යාතිරේඛය මේ අවස්ථාව සඳහා අදාළ නොවේ නම් පොදු අධිකාරිය අදාළ තොරතුරු ලබාදීමට කැමැත්ත පළ කරන බවයි. මෙකී නිලයන් මහජන මුදලින් වැටුප් ලබන බව සහ, ඒ අනුව මෙම තොරතුරු ඉල්ලා සිටීමට පුරවැසියාට අයිතියක් ඇති බව කොමිෂන් සභාව පොදු අධිකාරියට දැනුම් දුන්නේය.

අභියාචක සඳහන් කළේ තමන් තොරතුරු ඉල්ලීම ඉදිරිපත් කළ දිනය වන විට පැවති තත්වයට අදාළ තොරතුරු තමන් වෙත සපයන ලෙස ය. එය කළ හැකි නමුත් ඒ සඳහා නියෝගයක් අවශ්‍ය බව නම් කළ නිලධරයා සඳහන් කළේය.

**<u>කොමිෂන් සභාවේ නියෝගය</u>**

මෙම අභියාචනය පැන නගින්නේ අමාත්‍යවරුන් ඇතුලුව පළාත් සභාවේ සාමාජිකයන් 31 දෙනා වෙත ලබාදී ඇති කළමනාකාර සහකාරවරුන් සහ කාර්යාලය සහායකවරුන්ගේ තොරතුරු සැපයීම ප්‍රතික්ෂේප කිරීම මගිනි. තොරතුරු නිලධරයා විසින් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 5(1)(ඔ) වගන්තිය යටතේ එම තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කර ඇති අතර, අභියාචන බලතල ක්‍රියාත්මක කිරීම මගින් නම් කළ නිලධරයා ද එම ප්‍රතික්ෂේප කිරීම සාධාරණීකරණය කර තිබේ.

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 5(1)(ඔ) වගන්තිය මෙසේ ය.

*"එම තොරතුරු හෙළිදරව් කිරීම පාර්ලිමේන්තු වරප්‍රසාද හෝ නීතිය මගින් විධිවිධාන සලස්වා ඇති ආකාරයට පළාත් සභා වරප්‍රසාද උල්ලංඝනය කිරීමක් වන අවස්ථාවකදී.."*

තොරතුරු නිලධරයා විසින් ඉහත තොරතුරු හෙළිදරව් කිරීමක් කළේ නම් එවිට නීතිය මගින් විධිවිධාන සලසා ඇති පරිදි පොදු අධිකාරියේ කිසිදු වරප්‍රසාදයක් එයින් උල්ලංඝනය නොවන හෙයින් 5(1)(ඔ) මගින් පොදු අධිකාරියේ (උතුරු පළාත් සභාවේ) කිසිදු වරප්‍රසාදයක් දීර්ඝ කිරීමක් සිදුනොවන බව කොමිෂන් සභාවේ මතය වේ.

මේ තත්වය තුළ කොමිෂන් සභාව විසින් අභියාචනයට ඉඩ ලබාදෙන අතර, 23/02/2017 දිනය නමැති අයදුම්පතෙහි දිනයට අදාළව ඉල්ලා ඇති එකී තොරතුරු සපයන මෙන් පොදු අධිකාරියට නියෝග කරයි.

කොමිෂන් සභාවට පිටපතක් සහිතව සති දෙකක් ඇතුළත අදාළ තොරතුරු ලබාදෙන මෙන් කොමිෂන් සභාව පොදු අධිකාරියට නියෝග කරයි.